ශීර්ෂය 334 බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය - 334 බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 24 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තුමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2023 ජූනි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තුමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල

කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට  ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.  සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.  වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ  කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින්  යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.  වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව  ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) මූලධන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i) සමාලෝචිත වර්ෂයේ 2102 ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ වියදම රු.33,200 ක් වුව ද, එය ඒසීඒ 2(i) වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයේ රු.50,700 ක් ලෙස රු.17,500 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් වෙනත් දෙපාර්තමේන්තුවකට නිදහස් කරන ලද ප්‍රතිපාදන මගින් සිදුකරන ලද රු. 17,500 ක මිලදී ගැනීම්ද ඇතුළත්ව ඒසීඒ -02 (i) වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයෙහි රු. 50,700 ක් ලෙස දක්වා ඇති බව දක්වා තිබුණි. | සත්‍ය වියදම ගිණුම්ගත කිරීමට වගබලා ගත යුතුය. |
| ii) ඒසීඒ 2(ii) වියදම් ප්‍රකාශයේ මු.රෙ.208 යටතේ වෙනත් දෙපාර්තමේන්තු විසින් දරන ලද වියදම් ලෙස රු.17,500 ක් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබූ අතර ඉතිරිය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | .ඉහත අංක (i) හි දක්වා ඇති පරිදි වෙනත් දෙපාර්තමේන්තු මගින් දරන ලද වියදම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි ඇතුළත්ව නොමැති අතර එය 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇතිබව දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි අගය දැක්වීමට කටයුතු කළ යුතු වීම. |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තුමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව 2020 වර්ෂයේදී ආරම්භ කරන ලද නව දෙපාර්තමේන්තුවක් වන බැවින් හා 2022 වන තෙක් හානි හෝ පාඩු කිසිවක් වාර්තා වී නොමැති බැවින් , හානි හෝ පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොමැති අතර 2023 වර්ෂයේදී හානි හෝ පාඩු ලේඛනයක් ආරම්භ කිරීමට නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති බව දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුනරාවර්තන වැය විෂයයන් 05 ක් වෙනුවෙන් ප්‍රතිපාදිත රු.5,204,665,000 කින් රු.4,869,727,593 ක් ඉතිරිවී තිබුණු අතර එම ඉතිරිය සියයට 31 සිට සියයට 99 ක් දක්වා වූ පරාසයක් ගෙන තිබුණි. | 2022 වර්ෂය සඳහා අයවැය සකස් කිරීමේදී ඒ වනවිට බඳවාගෙන සිටි බහුකාර්ය සංවර්ධන සහයකයින් 33,714 දෙනෙකු ස්ථිරකොට 2022 වර්ෂය තුළදී ස්ථිර වැටුප් ගෙවීමටත්, 2022 වර්ෂයේ තවත් සහයකයින් 35000 ක් බඳවාගෙන ඔවුන් සඳහා මාස 06 ක පුහුණුවකින් අනතුරුව එම වර්ෂය තුළදී ම ස්ථිර වැටුප් ගෙවීමටත්, එම | වාර්ෂික ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සහයකයින්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා නිල ඇඳුමක් ලබාදීමටත්, සහයකයින් පුහුණු කිරීමේදී හා ස්ථිර කිරීමේදී දැරිය යුතු ඒ ආශ්‍රිත පුනරාවර්තන වියදම් වෙනුවෙනුත් ඇස්තමේන්තු සකස්කරන ලද නමුත්, ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 මගින් නව සේවක බඳවාගැනීම් කල් තැබීමත්, බඳවාගෙන සිටි සහයකයින්ට ස්ථිර පත්වීම් ලබාදීම සිදු නොවීමත් මත ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම්වලින් වැඩි ප්‍රතිශතයක් ඉතිරිවී ඇති බව දක්වා තිබුනි. | |
| (ආ) මූලධන වැය විෂයයන් 04 ක් සඳහා ප්‍රතිපාදිත රු.8,500,000 කින් රු.8,088,426 ක් ඉතිරිව තිබුණු අතර, එම ඉතිරිය සියයට 79 සිට සියයට 99 ක් දක්වා වූ පරාසයක්ගෙන තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 මගින් රජයේ වියදම් පාලනය කිරීමට ලබා දී ඇති උපදෙස් මත පැවති ප්‍රාග්ධන වත්කම් මගින් අවශ්‍යතා කළමනාකරණය කර ගැනීම නිසා ඇස්තමේන්තු ගත පරිදි ප්‍රතිපාදන උපයෝජනය නොකළ අතර ඒ අනුව ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දක්වා තිබුණි. | වාර්ෂික ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කළයුතු වීම. |
| (ඇ) 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 අංක දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3(xvii) ඡේදය ප්‍රකාරව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම් ඒවා වර්ෂය අවසන් වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුවත්, වැය විෂයයන් 12 ක් සඳහා | 2022 වර්ෂය තුළදී සැලසුම් කරන ලද පරිදි බහුකාර්ය සංවර්ධන සහයකයින්ට ස්ථිර පත්වීම් ලබාදීම මත ඔවුන් වෙත වර්ෂය පුරාම පුහුණු දීමනා ගෙවීමට සිදුවීමත්, ඉන්ධන, ජලය, විදුලිය හා සන්නිවේදන සේවාවල ගාස්තු සීඝ්‍රයෙන් ඉහළ යාමත් වැනි කරුණු මත වර්ෂය තුළ වැය විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමට සිදුවී ඇති බව දක්වා තිබුනි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුගතව කටයුතු කළයුතු වීම. |

| | | |
|---|---|---|
| රු.150,000 සිට රු.1,000,000,000 දක්වා සියයට 12 සිට සියයට 116 දක්වා පරාසයකින් ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි. | | |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (iii) බැඳීම් හා බැරකම් පිළිබඳ ප්රකාශයට අනුව බැරකම් රු.191,824,434 ක් වුව ද, බැරකම් ඉක්මවා රු.3,176,327 ක් ගෙවා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ බැරකම් එම වර්ෂය තුළ බැරකම් ප්‍රකාශයට අන්තර්ගත කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන ඒ ඒ වැය විෂයයන් තුළ නොතිබූ බැවින් බැරකම් ප්‍රකාශයට ඇතුළත් කර නොමැති නමුත් ප්‍රවර්තන වර්ෂයේ ප්‍රතිපාදන මගින් එම බැරකම් නිරවුල් කර ඇති බව දක්වා තිබුණි. | බැරකම් සියල්ල අනාවරනය කිරීමටත් දක්වා ඇති බැරකම් පමනක් නිරවල් කිරීමටත් වග බලාගත යුතුය. |

## 2.3 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩුව පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ බැංකු ජංගම ගිණුමෙහි 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශණය අනුව ශේෂය රු.29,190,089 ක් වුව ද මූල්‍ය ප්‍රකාශනයෙහි ඇමුණුම (viii) හි බැංකු ප්‍රකාශනය අනුව ශේෂය රු.29,040,089 ක් ලෙස රු.150,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ දෙසැම්බර් මස බැංකු සැසඳුම් වාර්තාව පිළියෙල කිරීමේදී වැරදීමකින් රු.150,000 ක් උපලබ්ධි නොවූ තැන්පතු ලෙස සැලකීම මත බැංකු ප්‍රකාශනයෙහි ශේෂය රු.29,040,089 ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (viii) හි දක්වා ඇත. නිවැරදි කරන ලද බැංකු සැසඳුම් වාර්තාව මේ වන විට විගණනයට ඉදිරිපත්කර ඇති බව දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දත්තයන් නිවැරදිව ඉදිරිපත් කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රැකියා ලක්ෂයේ වැඩසටහනේ අදියර 1 යටතේ 2020 දී බඳවා ගන්නා ලද පත්වීම්ලාභීන් 34,605 ක් NAITA ආයතනයේ පුහුණු වැඩසටහනට සහභාගි වී තිබුණු අතර පුහුණුව අවසානයේ ඉන් 1,592 ක් ඉවත්වී තිබුණි. | පළමු අදියර යටතේ 2020 වර්ෂයේදී බඳවාගන්නා ලද පත්වීම්ලාභීන් 34,605 ක් වූ අතර පුහුණුව අවසානයේදී ඉන් 1,592 ප්‍රමාණයක් ඉවත්ව තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 4.6 ක් බව දක්වා තිබුණි. | පුහුණුලාභීන් හැරයාම තුළින් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු ඉටු නොවන බැවින් හැරයාම අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ගගත යුතු වීම. |
| (ආ) රැකියා ලක්ෂයේ වැඩසටහනේ අදියර 2 යටතේ අලිවැට නඩත්තු සහායකයින් 3,544 ක් NAITA ආයතනයේ පුහුණු වැඩසටහනට සහභාගි වී තිබුණු අතර පුහුණුව අවසානයේ ඉන් 94 දෙනෙක් ඉවත්වී තිබුණි. | දෙවන අදියර යටතේ අලිවැට නඩත්තු සහයකයින් ලෙස බඳවාගත් පත්වීම්ලාභීන් 3,544 ක් වූ අතර පුහුණුව අවසානයේදී ඉන් 94 ක් ඉවත්ව තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 2.6 ක් බව දක්වා තිබුණි. | පුහුණුලාභීන් හැරයාම තුළින් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු ඉටු නොවන බැවින් හැරයාම අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ගගත යුතු වීම. |

### 3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු රජයේ නිලධාරීන් ඇප තබා නොතිබුණි. | අදහස් දක්වා නැත. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3.3 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ 2022 දෙසැම්බර් 31 දිනට බඳවාගත් පුහුණුලාභීන් 38,375 ක් වූ අතර ඉන් ඉවත් වූ මුළු පුහුණුලාභීන් සංඛ්‍යාව 7,317 ක් විය. මෙම පුහුණුලාභීන් සඳහා එක් අයෙකුට මාසිකව ගෙවන ලද රු 22,500 බැගින් වූ වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.මෙම ඉවත් වූ පුහුණුලාභීන් 7,317 ක් සඳහා එක් මාසයක දීමනාව රු. මිලියන 164.63 ක් විය. | රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ 2022/12/31 දිනට බඳවා ගත් පුහුණුලාභීන් 38,375 ක් අතරින් ඉවත් වූ සංඛ්‍යාව 7,317 ක් වන අතර ඔවුන් පුහුණු කාලසීමාවේදී විවිධ අවස්ථාවන්වලදී විවිධ හේතූන් මත ඉවත්ව ගොස් ඇත. ඔවුන් පුහුණුවේ පළමු මාසයේ න්‍යායාත්මක පුහුණුවෙන් අනතුරුව රජයේ විවිධ ආයතනවල සේවය කිරීම සඳහා අනුයුක්ත කරනු ලැබ ඇති බැවින් ඔවුන් වෙත ගෙවන ලද මාසික දීමනාවක් වෙනුවෙන් ඔවුන් විසින් එම ආයතනවලට සේවය සපයා ඇති බව දක්වා තිබුණි. | පුහුණුලාභීන් හැරයාම තුළින් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු ඉටු නොවන බැවින් හැරයාම අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ගගත යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වා සියලු මට්ටම්වල පුරප්පාඩු ප්‍රතිශතය සියයට 28 සිට සියයට 100 දක්වා පැවතුණි. | 2022/04/26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හි විධිවිධාන ප්‍රකාරව නව තනතුරු සඳහා බඳවාගැනීම් සියල්ල කල්තැබීම නිසා මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වා සියලු මට්ටම්වල පැවති පුරප්පාඩු පිරවීම සමාලෝචිත වර්ෂය තුළදී සිදු නොවූ බව දක්වා තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |